// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2385/19 – 2024 මැයි මස 22 වැනි බදදා – 2024.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2022/142.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල ( 131 වන පරිච්ඡේදය වන ) කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමඟ කියවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.10.30 වන දින අංක 2356/06 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2023.10.18 වැනි දින දරන නියෝගයෙන්,

එක් පාර්ශ්වයක් වශයෙන්,

එස්.පුෂ්පරාණි මිය, අංක. 524/4, සාන්ත වින්සෙන්ති නිවස, දියලගොඩ පාර, මග්ගොන.

අනෙක් පාර්ශ්වය වශයෙන්,

*සහ*

ඩී.පී.ජී. සුහාෂ් චමින්ද ප්‍රනාන්දු පියතුමා, සාන්ත වින්සෙන්ති නිවස, දියලගොඩ පාර, මග්ගොන.

අතර පවත්නා 2023.08.24 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතීඥ රණසිංහ ආරච්චිලාගේ තිලකරත්න මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතීඥ රණසිංහ ආරච්චිලාගේ තිලකරත්න මයා මෙම ආරාවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින්, යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2023.10.18 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2022/142.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

එක් පාර්ශ්වයක් වශයෙන්,

එස්.පුෂ්පරාණී මිය, අංක. 524/4, සාන්ත වින්සෙන්ති නිවස, දියලගොඩ පාර, මග්ගොන.

*සහ*

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ඩී.පී.ජී. සුහාෂ් චමින්ද ප්‍රනාන්දු පියතුමා, සාන්ත වින්සෙන්ති නිවස, දියලගොඩ පාර, මග්ගොන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් :

පන්නිපිටිය, කළල්ගොඩ පාර, ජෝන් කීල්ස් නිවාස සංකීර්ණය, 15, කැප්ටන් එම්. ජී.ජී.මෙන්ඩිස් මයා

පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනුෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 මැයි මස 16 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2022/142.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

එස්.පුෂ්පරාණී මිය, අංක. 524/4, සාන්ත වින්සෙන්ති නිවස, දියලගොඩ පාර, මග්ගොන.

*සහ*

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ඩී.පී.ජී. සුහාෂ් චමින්ද ප්‍රනාන්දු පියතුමා, සාන්ත වින්සෙන්ති නිවස, දියලගොඩ පාර, මග්ගොන.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ

'' සාන්ත වින්සෙන්ති නිවසෙහි සේවය කළ එස්.පුෂ්පරාණි මහත්මියගේ සේවය අත්හිට වූ බවට ඇය විසින් කරනු ලබන ප්‍රකාශය අනුව, ඇයගේ රැකියාව අහිමි වී පවතී ද අහිමි වී ඇත්නම් ඇයට යම් සහනයක් හිමිවේ ද එසේ සහනයක් හිමිවිය යුතු නම්, හිමිවිය යුතු සහන මොනවද යන්න පිළිබඳව වේ.''

**එච්.කේ.කේ.ඒ.ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 02 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදි.

EOG 05 - 0167

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.